



තොරතුරු-අමිල කෝසල උඩවත්ත-සමන් කුමාර විජේරත්න.

# අඛණ්ඩ කථන ශෛලිය

යම් කථාවක් අඛණ්ඩව ගලායන ලෙස චිත්‍රණය කිරීමේ ශෛලියයි. රූප රාමු කිහිපයක් ඉදිරිපත් කිරීම වෙනුවට එකම තීරයක කතාවේ විවිධ අවස්ථා එකදිගට ම සිත්තම් කරයි. එකිනෙකට ඉතා ආසන්න ඉරියව් හා සිද්ධි මෙසේ දූක්වෙයි. මේ පිළිබඳ අනවබෝධයෙන් සිත්තම් නරඹන්නෙකුට කතාව වටහා ගැනීම අපහසුය. (රූපය බලන්න. එහි ඇත්තේ සුජාතා කිරිපිඬු දනය පිළිගැන්වීමේ සිට සිද්ධාර්ථ ගෞතමයෝ පාත්‍රය අනෝමා නදියේ පා කර හරින අවස්ථාව දක්වා සිද්ධි මාලාව යි.

කාන්තා රූප සියල්ලෙන් ම සුජාතාවගේ විවිධ ඉරියව් දූක්වෙයි. බෝසතුන්ගේ වවිධ ඉරියව් දූක්වීමට ද බෝසතුන්ගේ රුව යළි යළි යොද ඇති අයුරු අධ්‍යයනය කරන්න. මෙහි තවත් විශේෂත්වයක් නම් කථාව දකුණේ සිට වමට විහිදී යාමයි. පළමු ව බෝසත්හු දුෂ්කරක්‍රියාවේ නිරතව සිටිති.

තොරතුරු-අමිල කෝසල උඩවත්ත-සමන් කුමාර විජේරත්න.

*(1) එ මග විමුක්තියට නොවන නිසා මැදුම් පිළිවෙත අනුගමනයට තීරණය කළ ද පස්වග තවුසෝ ඊට එදිරි වෙති(2). එහෙත් බෝසත්හු(3) තීරණය වෙනස් නොකොට ම අජපල් නුගරුක වෙත වැඩම කරති(4). ඒ මුල හිඳගනිති(5). සුජාතාව දන් පිළිගන්වන්නීය(6). වැඳ නමස්කාර කරන්නීය(7). පිටත්ව යන්නීය(8). බෝසත්හු දන් පාත්‍රය ද රැගෙන අනෝමා ගං තෙරට වඩිති(9).පාත්‍රය බිම තබා නදියට බැස පැන් පාසු වෙති(11). යළි පැමිණ කිරිපිඬු වළඳති(12). පාත්‍රය රැගෙන යළි නදිය වෙත වඩිති(13). පාත්‍රය පාවී යන වග දැක්වීමට පාත්‍රයේ රුව සිව්වරක් ඇඳ ඇත. ගංගාව ගලන දිශාව මත්ස්‍යයින්ගෙන් දක්වා ඇත. ඊට අනුව පාත්‍රය උඩු ගං බලා පාවෙයි. බෝසත්හු(14) කුසතණ පිළිගන්නා අයුරු ද දැක්වේ(15). ) මෙම ක්‍රමය ප්‍රචලිත වූයේ මහනුවර යුගයේ දී ය. (සිතුවම-ශ්‍රී සුදර්ශනාරාම මහා විහාරය-දොඩන්ගොඩ,කළුතර)*

තොරතුරු-අමිල කෝසල උඩවත්ත-සමන් කුමාර විජේරත්න.